**ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන් දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 චක්‍රලේඛයේ 3.1 ඡේදය පරිදි CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් SA 21 ආකෘතියේ පිළියෙල කරන ලද අවසාන භාණ්ඩාගාර ශේෂ පිරික්සුම ඉදිරිපත් කළ යුතු වුවද, 2021 දෙසැම්බර් මාසයට අදාළ ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශනයට ඉදිරිපත් කර තිබුණි. | CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් ලබා ගත් වර්ෂ අවසාන ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශනයට අමුණා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 චක්‍රලේඛ පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම |
| (ආ) මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 ඡේදයෙහි වාර්තාකරණ ආයතනය විසින්, වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරනු ලබන ආදායම, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා ද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.21,482,750ක් දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි. | මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 ඡේදය අනුව, වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් අප දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායම රු.21,482,750 අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකල අතර, එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් යටතේ ඇතුලත් කර ඇතිබව, වැඩිදුරටත් දන්වා සිටිමි. එසේම 2020 වසර සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ගලපා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2020 නැවත ගලපන ලද තීරුවට ඇතුලත් කර ඇති බව කාරුණිකව දන්වමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 චක්‍රලේඛ පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

--------------------------------

**1.6.2.1 මූල්‍ය නොවන වත්කම්**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මිනිස්බල දෙපාර්තමේන්තුවේ වත්කමක් ලෙස ගිණුම් ගත කර තිබුණු කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රු.4,700,000 වූ කැබ් රථය, ආපසු කම්කරු දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීමේදී මූල්‍ය වත්කම් වලින් අඩු කිරීම් ලෙස දැක්විය යුතු වූවද අපහරණය ලෙස දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූලධන වැය විෂයන් 06 ක් හා පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.32,850,307 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | අභ්‍යන්තර චක්‍රලේඛ 07/2021 අනුව, ආයතනයේ වියදම් සීමා කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, නියමිත අනුමැතින් යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබුණද, ඒ වන විට ආරම්භකර නොමැති වැඩසටහන්, මිලදී ගැනීම්, වැඩිදියුණු කිරීම්, සහනාධාර, දීමනා ගෙවීම් ආදිය තාවකාලික අත්හිටුවීමට කටයුතු කර ඇත. එබැවින් අප විසින්, දක්වා ඇති වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරි කර දෙන බවට භාණ්ඩාගාරය වෙත තහවුරු කර ඇත. එසේම රටෙහි පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | අපේක්ෂා කල පරිදි වියදම් සිදු නොවීය. | |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | --------------------------------- | ------------ |
| රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හා 2021 ඔක්තෝම්බර් 26 දිනැති චක්‍රලේඛයේ 3.5 ඡේදය පරිදි 2021 වර්ෂය තුළ යම් දෙපාර්තමේන්තුවක් විසින් වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් භාණ්ඩ හා සේවා ලබා ගෙන ඇත්නම් ඊට අදාල බිල්පත් 2021 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර පියවා ගිණුම් ගත කිරීමට පියවර ගත යුතු බවට දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට අවස්ථා 28ක දී ඇතිකරගත් රු.4,563,252ක බැරකම් අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය . | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හා 2021/10/26 දිනැති චක්‍රලේඛයේ 3.5 ඡේදයේ පරිදි 2021 වර්ෂය තුළ ලබාගත් භාණ්ඩ හා සේවා වලට අදාලව බිල්පත් ගිණුම් ගතකර පියවිය යුතු වුවත්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම් හා අක්මුදල් ප්‍රමාණවත් නොවීම හෝ ප්‍රමාදවී වවුචර්පත් ලැබීම් වර්ෂයට අදාළ බිල්පත් ගෙවීම එළඹෙන වර්ෂයේදී සිදු කරන ලදී. | බැරකම් වලට එලබීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3** **අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------------- | ------------------ |
| මුදල් රෙගුලාසි 371(5) පරිදි කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කල යුතු වුවද නිලධාරීන් හතර දෙනෙකු වෙත අවස්ථා 13 දී ලබා දී තිබුණු අග්‍රිම මුදල් පියවීම දින 17 සිට දින 165 දක්වා කාල ප්‍රමාදයකින් නිරවුල් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් සිදු නොවීමට පියවර ගන්නා ලෙසට විෂයභාර නිලධාරී දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රැකියා පියස වැඩසටහන යටතේ වූ කොරියානු ජනරජයේ රැකිරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය විසින් කොරියානු - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති උපදේශනාත්මක වැඩසටහනට අදාල ව්‍යාපෘතිය සේවා නියුක්ති ප්‍රතිපත්ති සහ ශ්‍රම වෙළඳපොල සක්‍රීයකරණ වැඩසටහන් මහජන රැකියා සේවා සංවිධානය කිරීම, ව්‍යුහය හා වැඩසටහන් පිළිබඳ ඵලදායී ක්‍රමවේද හුවමාරු කිරීම යන ක්ෂේත්‍ර යටතේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී තිබුණි. ඒ අනුව 2020 ජුනි 23 දින ශ්‍රී ලංකාවේ මහජන රැකියා සේවය නඟාසිටුවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව ඇගයීම සඳහා 2020 නොවැම්බර් 18 වන දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන තිබුණි. කොරෝනා වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘතියට අදාළව කිසිදු ක්‍රියාකාරකමක් 2021 වසරේ සිදු වී නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතියට අදාළ කිසිදු ක්‍රියාකාරකමක් 2021 වසරේ සිදුනොවුණි. 2022/02/23 වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් ප්‍රධානත්වයෙන් කොරියානු රජය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී කොරියානු රජය විසින් ඉදිරි සැලසුම් ඉදිරිපත් කිරීමට එකඟ වූ අතර එම සැලසුම් පිළිබඳව සාකච්ඡා කලෙමු. 2022/03/23 දින මෙම ව්‍යාපෘතියෙහි වර්තමාන තත්වය හා ඉදිරි සැලසුම් පිළිබඳව වැඩිදුරටත් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කල අතර මෙම ව්‍යාපෘතියෙහි යෝග්‍යතාවය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලය හරහා වාර්තාවක් ලබා ගැනීමට යෝජනා කරන ලද අතර කොරියානු රජය විසින් තොරතුරු තව දුරටත් ලබා දීමට එකඟ විය. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට සහ කාර්යය සාධනය උපරිමයට ලබා ගත හැකි පරිදි ව්‍යාපෘති සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ආ) ශ්‍රම වෙළඳපොල තොරතුරු සඳහා කලමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට මෘදුකාංග ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු පමණක් ආරම්භ කර තිබුණු අතර එම ව්‍යාපෘතියේ ප්‍රගතියක් අත්කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කටයුතු හරහා Belvantage (Pvt) Ltd ආයතනය මෙම කළමණාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා තෝරාගන්නා ලද අතර එහි පළමු අදියර ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් 1,980,000.00 මුදලක් Belvantage (Pvt) Ltd ආයතනය වෙත ලබා දෙන ලදි. එහි දෙවන | අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට සහ කාර්යය සාධනය උපරිමයට ලබා ගත හැකි පරිදි ව්‍යාපෘති සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | අදියර මේ වන විට සාර්ථකව නිම වෙමින් පවතී. | |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 05 ක්, ද්වීතික මට්ටමේ පුරප්පාඩු 26 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 05 ක් ඇතුළු මුළු පුරප්පාඩු 40 ක් පැවතුණි. අධ්‍යක්ෂ තනතුරු 04 ක්ද, අභ්‍යන්තර විගණක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි හා භාෂා පරිවර්තක එක තනතුරක් බැගින්ද, සංවර්ධන නිලධාරි තනතුරු 15 ක් හා කළමනාකරණ සේවා නිලධාරීන් 11ක් ඇතුළු මුළු සේවක ඌනතාවයන් සම්පූර්ණ කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 20 න් 16 ක් මේ වන විට සම්පූර්ණ වී ඇත. තෘතීක මට්ටමේ පවතින තනතුරු 05 සඳහා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට මේ දක්වා හැකි වී නොමැත. | දෙපාර්තමේන්තු කාර්යසාධනය සැළකිල්ලට ගෙන හිග කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වීම |